# මුහුදු ජලය ඇයි ලුණු රස?



සනුමි සහන්සා අබේසුන්දර

# මුහුදු ජලය ඇයි ලුණු රස?


කතාව සහ චිත්‍ර

**සනුමි සහන්සා අබේසුන්දර**



**ISBN: 978-624-211-332-6**



**6** වන **ශ්‍රේණිය**

**මහ / මහමායා බාලිකා විද්‍යාලය**

**පිදුම**

**හෙට ලොව**

**දිනන්නට**

**මා හට දිරිය දෙන**

**මව්පියන් ගුරුවරුන්**

**දෙපා වැඳ පුදන්නෙමි.**

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යා දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍යා දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

සමීර කියන්නේ වයස අවුරුදු දහයක පුංචි දක්ෂ දරුවෙක්. ඔහු ජීවත් වුනේ මුහුද අසල ලස්සන ගමකයි. සමීර බොහෝ දේවල් හොයලා බලලා ඉගෙන ගන්න කැමති දරුවෙක්. ඒක නිසා පාසලේ ගුරුවරු එයාට හරිම ආදරෙයි.

පාසල් ගිහින් ගෙදරට ආවට පස්සේ හවසට මුහුදු වෙරළට ගිහිල්ලා රැල්ල ගහන හඬ අහන්නත් මුහුද දිහා බලා ඉන්නත් සමීර ආස කළා. අම්මා එයාට කියලා තිබුනා තනියම මුහුදු රළ පාගන්න යන්න එපා කියලා. ඒක නිසා මුහුදේ ලස්සන බලන්න ගියාට එයා රැල්ල පාගන්න නම් ගියේ නැහැ.



සමීර ගොඩක්ම ආස කළේ හැමදාම හවසට ඉර බැහැලා විදිහ බලන්නයි. ඒවෙලාවට ඉරේ පාට වෙනස් වන විදිහ බලලා එයා ගෙදර ඇවිත් ලස්සනට චිත්‍ර අදින්නත් අමතක කළේ නැහැ.

එක දවසක් සමීරගේ අම්මා වැඩට ගිහින් කලින් ගෙදර ආවා. සමීර අම්මටත්  කතා කලා මුහුදු වෙරළට යන්න. අම්මත් සමීරගේ යෝජනාවට කැමති උනා. " එහෙනම් පුතා අපි රැල්ල පාගන්තත් යමු." සමීර සතුටෙන් උඩ පැන්නා.

ඊට පස්සේ සමීර තම මව සමඟ මුහුදු වෙරළේ ඇවිදින්න ගියා.



සමීර මුහුදු රැල්ල පාගමින් සතුටු උනා. ඔහොම සෙල්ලම් කර කර ඉන්න කොට මුහුදු වතුර ටිකකුත් පෙවුනා.එවිට ඔහුට ලුණු රස දැනුණා. එතකොට එයට අම්මගෙන් අහන්න හිතාගෙන හිටපු ප්‍රශ්නයක් මතක් වුණා.

"අම්මේ, මම අම්මගෙන් අහන්නමයි හිටියේ , මුහුදු වතුර ඇයි ලුණු රස?" කියලා සමීර ඇහුවා.



මව සිනාසුනා. ඊට පස්සේ ඇය පැහැදිලි කරන්න පටන් ගත්තා

“වැසි  වැටෙනකොට පුතා ඒ වැසි ජලය ගල්, කඳු සහ මැටි උඩින් ගලාගෙන යනවා. වැසි ජලය ගල්, කඳු සහ මැටි උඩින් ගලාගෙන යන කොට, ගල්වල තියෙන ලුණු සහ ඛනිජ ද්‍රව්‍ය කුඩා කොටස් වශයෙන් ජලයට එකතු වෙනවා. ඒ ජලය ගඟවල් හරහා ගලා ගෙන ගිහින් අවසානයේ මුහුදට එකතු වෙනවා.”



“හරි අම්මා ඒක මට තේරුණා. ඒ උනාට කාලයක් ගියාම ලුණු නැති වෙන්නේ නැද්ද අම්මේ?” කියලා සමීර ඇහුවා.

“නෑ පුතා,” මව පැහැදිලි කළා.

“මුහුදෙන් ජලය වාෂ්ප වෙලා වළාකුළු වෙනවා. ඒ වුණාට ලුණු මුහුද ඇතුළෙම ඉතිරි වෙනවා. ඒ නිසා වසර ගණනාවක් තිස්සේ ලුණු මුහුදේ එකතු වෙලා තියෙනවා.”



ඊට පස්සේ සමීර තවත් ප්‍රශ්නයක් ඇහුවා.

"අම්මේ, මුහුදු ජලයේ ලුණු තියෙන එක හොඳද?"

මව පිළිතුරු දුන්නා,

"ඔව් පුතා. මුහුදු ජලයේ ලුණු මුහුදේ ජීවීන්ට හරිම වැදගත්. මාළු, කකුළුවන් සහ මුහුදු පැළෑටි ලුණු සහිත ජලයට හුරු වෙලා ජීවත් වෙනවා. ලුණු නැත්නම් ඔවුන්ට ජීවත් වෙන්න අමාරු වෙයි."



ඇය තවත් කියා දුන්නා,

"මුහුදු ලුණු මිනිසුන්ටත් ප්‍රයෝජනවත්. අපි කෑමට භාවිතා කරන ලුණුත් මුහුදෙන් ලබා ගන්නවා."එවිට සමීරට  තවත් කුතුහලයක් ආවා,


"අම්මේ, මුහුදු ජලයෙන් ලුණු කොහොමද ගන්නේ?"

මව කෙටියෙන් පැහැදිලි කළා,
"මුහුදු ජලය ලුණු තටාකවලට හරි තැටි වලට දාලා ඉර එළියේ වේලන්න දැම්මම, ජලය එහෙම නැත්නම් වතුර ටික වාෂ්ප වෙලා යනවා. වතුර ටික වාෂ්ප වෙලා ගියාම, ලුණු ඉතිරි වෙනවා. ඊට පස්සේ ලුණු ටික පිරිසිදු කරලා ආහාරයට ගන්න පුළුවන්.".



"ඒ උනාට අම්මේ මිනිස්සු මුහුදට කුණුත් දානවා නේද ?", සමීර තවත් කුතුහලෙන් ඇහුවා.


"ඔව්. එක නම් ඇත්ත. සමහර මිනිස්සු මුහුදට කෙලින්ම විතරක් නෙවෙ මුහුදට ගලාගෙන යන ජල පාර වලටත් ගංගා වලටත් පොලිතින්, ප්ලාස්ටික් වගේ දිරන්නේ නැති බොහෝ දේවල් දානවා. ඒ විතරක් නෙවේ ඔයාට ගුරුවරු කියලා දීලත් ඇති කර්මාන්ත ශාලා වලින් පිටවන විෂ රසායන ද්‍රව්‍යත් මුහුදු ජලයට එකතු කරනවා.", අම්මා තවදුරටත් පැහැදිලි කළා.



එතකොට අම්මා, මුහුදේ මාලු එහෙම මැරෙනවා ඇති නේද ? සමීර දුකෙන් ඇහුවා. "ඔයා හරියට හරි පුතා. මුහුදේ මාලු විතරක් නෙවේ මුහුදු ජීවින් වර්ග ගොඩක් ඉන්නවා. ඒ වගේම මුහුදු පැළෑටි, කොරල් වගේ දේවලුත් ගොඩක් තියෙනවා. ඒවටත් මේ අපද්‍රව්‍ය දාන එකෙන් හානි වෙනවා විතරක් නෙවෙ ඒවා කෑමට ගන්න අපිත් ලෙඩ වෙනවා", අම්මත් දුකෙන් කිව්වා.

මේකට අපිට මුකුත් කරන්න බැරිද අම්මා. සමීර කල්පනාවෙන් ඇහුවා.

අම්මා ටිකක් හිනාවෙලා මෙහෙම කිව්වා. " පුතා හොඳට ඉගෙන ගන්න. එහෙම ඉගෙන ගෙන මුහුද ආරක්ෂා කරන්න විදිහක් හොයාගන්න. එහෙම නැති උනොත් මුහුදේ ලුණු රසත් නැති වෙලා යන්න පුලුවන් ".



මේ සියල්ල අසා සමීරට තේරුණේ, මුහුද කියන්නේ ලස්සන තැනක් විතරක් නොවෙයි, විද්‍යාත්මක දැනුම ඉගෙනගන්න පුළුවන් විශාල ස්වභාවික විද්‍යාගාරයක් කියලා. ඒවගේම මුහුද ආරක්ෂා කරන්න විදිහක් හොයාගන්න හොඳට ඉගෙන ගන්න ඕනේ කියලා සමීර අධිෂ්ඨාන කරගත්තා.

"අම්මා අද නම් මම ගොඩක් දේවල් ඉගෙන ගත්තා". සමීර කිව්වා.

අම්මා ආදරයෙන් සමීරගේ හිස අත ගෑවා.

"මම ලොකු වෙද්දී මුහුද ගැන ඉගෙනගෙන මුහුද රැක ගන්න උදව් කරන විද්‍යාඥයෙක් වෙන්න ඕන." ඔහු සිතුවා.

මුහුදු රළ හඬ අතර, සමීරගේ සිත තුළ මුහුද ට ඇති ආදරය තවත් වැඩි වුණා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-332-6